# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2222/37 - 2021 අප්‍රේල් මස 07 වැනි බදාදා - 2021.04.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

1. 2020 නොවැම්බර් මස 17 වන දින අංක 2202/7 දරන රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග මගින් සංශෝධනය කරන ලද 2020 අප්‍රේල් මස 8 වන දින අංක 2170/4 දරන රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග, පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

   (අ) 1 වන ඡේදයෙහි දැක්වෙන ''මාස දොළහක'' යන වචන මෙමගින් ඉවත් කරනු ලබන අතර එම වචන වෙනුවට ''මාස විසිහතරක'' යන වචන ආදේශ කරනු ලැබේ.

2. 2020 නොවැම්බර් මස 17 වන දින අංක 2202/7 දරන රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග මගින් සංශෝධනය කරන ලද 2020 ජූලි මස 1 වන දින අංක 2182/32 දරන රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග, පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

   (අ) 1 වන ඡේදයෙහි සහ 2 වන ඡේදයෙහි දැක්වෙන ''මාස 12 ක්'' යන වචන මෙමගින් ඉවත් කරනු ලබන අතර එම වචන වෙනුවට ''මාස 24 ක්'' යන වචන ආදේශ කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.